## ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය - 2013

ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ **14(2)**(සී) වගන්තිය ප්‍රකාර, ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව, රු. 2,396,227 ක පෙර වර්ෂ ගැළපීම් ආරම්භක ශේෂයට ගැළපිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයට ගැළපීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය වැඩියෙන් දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ප්‍රදාන ලෙස ලැබී තිබූ වෑන් රථ දෙකක් රාජ්‍ය ප්‍රදානයක් ලෙස නොසලකා ආයතනයේ අරමුදලට ගැළපීම් කර තිබූ අතර, එහි වටිනාකම ගිණුම්ගත කිරීමේදී පිළිගත් තක්සේරු වටිනාකමක් ලබා ගැනීම වෙනුවට රක්ෂණය සඳහා කරන ලද තක්සේරු වටිනාකම වූ රු.15,200,000 ක් අදාළ කරගෙන තිබුණි.

(ආ) පෙර වර්ෂයේදී ආයතනයෙන් ඉවත් කිරීමේ අරමුණින් ජංගම වත්කම් යටතේ ඉදිරියට ගෙනවිත් තිබුණු රු. 26,624,391 ක් වටිනා රසායනාගාර උපකරණ හා ලී බඩුවලින් රු. 24,915,351 ක් වටිනා වත්කම් විෂයයන් ඉවත් නොකර සමාලෝචිත වර්ෂයේදී ද ජංගම වත්කම් යටතේ ඉදිරිපත් කර තිබුණි.

(ඇ) ආයතනයේ නිලධාරීන් තිදෙනෙකු වෙත ගෙවිය යුතු එකතුව රු. **57,848** ක ගමන් වියදම් උපචිත වියදම් යටතේ නොදක්වා සැපයුම් හා සේවා ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂවලදී අපහරණය කර තිබූ හා තොග සමීක්ෂණ වාර්තා අනුව භෞතිකව නොපවතින බව තහවුරු කර තිබූ වටිනාකම රු. **658,020** ක වත්කම් තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් ලෙස දක්වා තිබුණි.

2.2.3 **නොසැසඳු පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 07 කට අදාළ උප වාර්තා හා ලෙජරවල ශේෂයන් අතර රු.314,639 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන රු. 131,968 ක් ගෙවිය යුතු ණයහිමි ශේෂ 03 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සැපයුම් සේවා සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු. **105,851** ක විදේශ අත්තිකාරම් ලබා දී ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් දින වනවිටත් අදාල භාණ්ඩ ආයතනයට සපයා නොතිබුණි.

(ඇ) වටිනාකම රු. 825,751 ක් වූ සැපයුම් හා සේවා ණයහිමි ශේෂ 17 කට අදාළව ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කර නොතිබුණි.

2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනා ගෙන ඇති පාවිච්චි නොකරන ලද රු.**2,994,823** ක වත්කම් පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ආ) | 2011 මාර්තු 07 දිනැති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අංක **RID/PAYE/REG**/01 හා 2011 අයවැය යෝජනාව | **i.** | ආයතනයේ ආචාර්ය මණ්ඩලයේ දහනව (19) දෙනෙකුගෙන් 2013 වර්ෂයට අදාලව රු.**212,884** ක උපයන විට බදු අඩුවෙන් අයකර තිබුණි. |
| | | **ii.** | හිඟ වැටුප් මත අයකරගෙන තිබූ රු. 14,373 ක උපයන විට බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නියමිත කාලය තුළ ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත හා අංක ප්‍ර/ආයතන/11 හා 2001 අගෝස්තු 24 දිනැති කම්කරු කොමසාරිස්ගේ ලිපිය | | අධ්‍යයන දීමනා ජීවන වියදම් දීමනාවක් ලෙස නිර්වචනය නොවන බැවින්, මෙම දීමනාව සේවක අර්ථසාධක අරමුදලට, විශ්‍රාම වැටුප් අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකත්වයට අදාල කර නොගත යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ඉහත අරමුදල්වලට ගෙවන ලද මුළු මුදල රු.1,002,418 ක් විය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | මුදල් රෙගුලාසි 110 | | 2012 සහ 2013 වර්ෂවලදී වාහන අනතුරු 04 ක් සිදු වී ඇතත්, ඒවා සටහන් කිරීමට හානි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක 26/2010 හා 2010 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනමින් රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවාගැනීම නොකළ යුතු වුවත්, ඊට පටහැනිව බඳවා ගත් නිලධාරීන් 09 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.919,695 ක වැටුප් ගෙවා තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ එකතුව රු. **2,285,906** ක් වටිනා ජ්නල් 13 ක් අනුමත කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඌනතාවය රු. 28,164,597 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.24,050,040 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,114,557 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් විකිණීමේ අලාභය රු. 1,570,623 කින්ද, පෙර වර්ෂ ගැලපීම රු. 2,396,227 ක් හා මෙහෙයුම් වියදම රු.6,253,235 කින් වැඩිවී තිබීම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව ඌනතාවය රු. 4,114,556 කින් වැඩි වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිලධාරීන් 30 දෙනෙකු විසින් 1998 සිට 2012 දක්වා කාලපරිච්ඡේදය තුළ ආයතනයේ පුස්තකාලයෙන් ලබා ගත් පොත් 203 ක් වසර 02 සිට වසර 15 කාලයක් ගත වී ඇතත් ආපසු භාර දී නොතිබුණි.

(ආ) පර්යේෂණ / පරීක්ෂණ කටයුතුවලට අදාල නොවන පොත් 17 ක් වර්ෂ **1** - 10 අතර කාලපරාසයකට වැඩි කාලයක් නිලධාරීන් 08 දෙනෙකු විසින් ළග තබා ගෙන ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.**2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති අංක **PED/12** දරන චක්‍රලේඛයේ 5.2.2 ඡේදයේ ප්‍රකාරව, රු. 500,000 ක වැඩි ගෙවීම් සඳහා ශක්‍යතා

අධ්‍යයනයක් සිදු කළ යුතු වුවද, එවැනි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන් තොරව, 2011 සහ 2012 වර්ෂවලදී එකතුව රු. 9,144,000 ක් වැය කොට ජල පිරිපහදු ඒකක 08 ක් ඉදිකර තිබුණි. එයින් රු.6,013,702 ක් වැයකර ඉදිකර තිබූ ජල පිරිපහදු 05 ක් වර්ෂයක් ඉක්මවීමට ප්‍රථම අක්‍රීය වී තිබුණි.

(ආ) **i.** ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයේ ආපනශාලාව පවත්වාගෙන යාමට අදාල ගිවිසුමේ 16 වන වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් ආපනශාලාවේ කළමනාකරු හා සේවකයින් වෙත නවාතැන් පහසුකම්ද, භාණ්ඩ තබා ගැනීම සඳහා ගබඩා පහසුකම්ද සපයා ඇතත්, ඒ වෙනුවෙන් ගිවිසුමේ 06 වන වගන්තිය ප්‍රකාරව ආයතනයට කුලියක් අය නොකොට කොන්ත්‍රාත්කරු වෙත මාසිකව රු.25,000 ක් බැගින් සමාලෝචිත වර්ෂය තුළදී රු. 300,000 ක් ගෙවීම් කොට තිබුණු අතර, ආයතනය විසින් නිලධාරීන් සඳහා තේ සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ආපනශාලා කොන්ත්‍රාත්කරු වෙත රු. 1,190,003 ක් ගෙවීම් කර තිබුණි.

**ii.** ගිවිසුමේ 17 වන වගන්තිය ප්‍රකාරව, කොන්ත්‍රාත්කරු විසින් ආයතනයට අයත් උපකරණ පාවිච්චි කිරීම වෙනුවෙන් රු. 100,000 ක රක්ෂණාවරණයක් සැපයිය යුතු වුවද, 2013 දෙසැම්බර් 31 දිනටද කොන්ත්‍රාත්කරුගෙන් එවැනි රක්ෂණාවරණයක් ලබාගෙන නොතිබුණි.

4.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්
---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වටිනාකම රු. 1,312,752 ක ස්ථාවර වත්කම් අයිතම් 37 ක උපකරණ අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයන් අනුගමනය නොකිරීම හේතුවෙන් නිෂ්ක්‍රීයව පැවතුණි. තවද, කැඩුණු භාණ්ඩ අයිතම් 04 ක වටිනාකම රු.8,000 ක් පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට රසායනික ද්‍රව්‍ය තොග ගබඩා හා තොග සමීක්ෂණ වාර්තා පරීක්ෂාවේදී රු. **548,555** ක් වටිනා අයිතම 86 ක් දීර්ඝ කාලීනව චලනය නොවන තොග ලෙස නිරීක්ෂණය වූ අතර, ඉන් රු. 220,625 ක් වටිනාකම් සහිත අයිතම 17 ක් අධිශීතාගාර තුළ රඳවා තිබුණි. මෙම අයිතමයන් සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනටද නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) වටිනාකම රු. 334,403 ක් වූ සෙමින් චලනය වන රසායනික ද්‍රව්‍ය තොග අයිතම 67 ක් ගබඩා කර තිබුණි.

(ඈ) 2012 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන ජල පිරිපහදු ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කළයුතු ජල පිරිපහදු ඒකක 10 න් 2013 දෙසැම්බර් 31 දින වන විටත්, ජල පිරිපහදු ඒකක 02 ක් ඉදි කිරීමට කටයුතු කර නොතිබුණු අතර, ඒ වෙනුවෙන් රු.2,341,472 ක මුදලක් වසර 02 මාස 06 ක කාලයක් තිස්සේ බැංකු ජංගම ගිණුමේ නිෂ්ක්‍රීයව ඇති බව නිරීක්ෂණය විය.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සහකාර ගණකාධිකාරී තනතුරේ පත්වීම් ස්ථිර කර උසස්වීම් ලබා දී වැරදි වැටුප් තලවල පිහිටුවා බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල නොවන ලෙස වැටුප් ගෙවීම හේතුවෙන් රු. 415,794 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන පර්යේෂණ සභාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කරන නිලධාරිනියට එක් සභාවාරයක් වෙනුවෙන් පිළිවෙලින් රු.1,500 සහ රු.2,000 බැගින් සහ රියදුරු තනතුරු සඳහා බඳවාගන්නා ලද නිලධාරියාට රියදුරු වැටුපට අමතර කාර්යාල කටයුතු වෙනුවෙන් මාසිකව රු. 2,000 බැගින් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.20,000 ක් ගෙවා තිබුණි.

(ඇ) රයිසෝබියම් ව්‍යාපෘතිය

**(i)** විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මූලික අධ්‍යයන ආයතනය වෙත 2011 අගෝස්තු 31 දින සිට පවරා දී ඇති රයිසෝබියම් ව්‍යාපෘතිය යටතේ සෝයා බෝංචි සඳහා වූ රයිසෝබියම් ආමුකුල නිෂ්පාදන නම් වූ දියර පොහොර විශේෂයට අදාල ව්‍යාපෘතියෙහි පර්යේෂණ නිලධාරීවරයාහට මූලික අධ්‍යයන ආයතනයේ ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය තුළදී රු. 505,500 ක වැටුපක් ගෙවා තිබුණි.

**(ii)** 2013 වර්ෂය තුළදී රු.2,860,767 ක ආදායමක් උපයා රු.1,138,781 ක වියදමක් දරා තිබුණු නමුත්, ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනයේ අරමුණුවලට අදාල නොවූ ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය.

**(iii)** මූලික අධ්‍යයන ආයතනය මඟින් සිදුකළ පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස සොයා ගන්නා ලද රයිසෝබියම් ආමුකුල නිෂ්පාදන නම් වූ දියර පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගන්නා කොහුබත් රෝපණ මාධ්‍ය සොයා ගැනීම වෙනුවෙන් පේටන්ට් බලපත්‍රය ආයතනය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබීම නිසා ආයතනයේ රු.2,533,800 ක නිෂ්පාදන වෙළඳපලට ඍජුව අලෙවි කිරීම වෙනුවට ආයතන 05 ක් මඟින් අලෙවි කිරීම් සිදුව තිබුණි.

4.5 දෘශ්‍ය අක්‍රමිකතා

සමාලෝචිත වර්ෂයේ ජල බිල්පත් ගාස්තුව රු. 1,294,409 ක් විය. මාසික ජල බිල්පත් ගාස්තු වියදම් රු. 27,668 ක සිට රු.137,110 ක පරාසයක් දක්වා අසාමාන්‍ය වැඩිවීමක් නිරීක්ෂණය විය.

4.6 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී රු. 2,360,000 ක් වැය කර ඉදිකරන ලද අංක 111**A** දරන හරිතාගාරය 2013 මාර්තු මාසය වන විටත්, එහි ඇතුළත උෂ්ණත්වය අධික වීම හේතුවෙන් උපරිම කාර්යක්ෂමතාවයකින්, ඵලදායිතාවයෙන් හා ආර්ථිකභාවකින් පාවිච්චියට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට පැවත එන පර්යේෂණ අරමුදල් 05 ක එකතුව රු. 512,796 ක ශේෂ සමාලෝචිත වර්ෂයේදීත් උපයෝජනය කොට නොතිබුණි.

4.7 අවිනිශ්චිත ගනුදෙනු

සාමාජික ගාස්තු ගෙවීම

සහරා සහ වාර සහරා ලබා ගැනීම සඳහා විදේශීය රටවල විවිධ ආයතන වෙත සාමාජිකත්වය ලබා ගැනීම සඳහා එකතුව රු. **72,112** ක් ගෙවීම් කර ඇතත්, සහරා සහ වාර සහරා ආයතනය වෙත ලැබී තිබුණේද යන්න විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

4.8 ප්‍රමාද වූ ව්‍යාපෘති

ඉදිකිරීම් 05 ක් වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවන ලද අත්තිකාරම් මුදල්වලින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට අයවිය යුතු රු. **1,782,802** ක අත්තිකාරම් ශේෂය 2013 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.9 සේවක පාරිතෝෂික මුදල් ආයෝජනය කිරීම

සේවක පාරිතෝෂික සඳහා ආයතනයේ වෙන් කර තිබූ රු. 15,640,909 ක මුදලක් ඵලදායී ලෙස ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති අංක **PED/12** දරන චක්‍රලේඛයේ 5.1.3 ඡේදය පරිදි සංයුක්ත සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කර සෑම වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යන අය වෙත යොමු කළයුතු වුවද, 2012-2015 සඳහා වූ සංයුක්ත සැලැස්ම එපරිදි ඉදිරිපත් කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ අභ්‍යන්තර විගණන වැඩසටහන ක්ෂේත්‍ර 21 ක් ආවරණයවන පරිදි පිළියෙල කර තිබුණද, ඉන් ක්ෂේත්‍ර 13 කට අදාලව විගණන කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) කළමනාකරණ විගණන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක **DMA/2009(1)** හා 2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, මූල්‍ය විගණනයට අමතරව පද්ධති විශ්ලේෂණය, කාර්යසාධන විශ්ලේෂණයක් හා විශේෂ විමර්ශන කෙරෙහි විගණන කටයුතු යොමු කර නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කර කළමනාකරණ හා විගණන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ ඉදිරිපත් කර නොතිබුණි.

5.3 කළමනාකරණයට වාර්තා ඉදිරිපත් කිරීම

රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති අංක **PED/12** දරන චක්‍රලේඛයේ 4.2 ප්‍රකාරව, සෑම මසකට වරක් කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

i. මාසයට අදාල මෙහෙයුම් වාර්තා
ii. මාසයට අදාල මුදල් ප්‍රවාහ ප්‍රකාශන
iii. ද්‍රවශීල තත්ත්වය සහ ණය ගැනීම්
iv. මාසය තුළ ජංගම නොවන වත්කම් මිලදී ගැනීම් හා ප්‍රසම්පාදන කටයුතු
v. නව බඳවා ගැනීම් හා අනුමත කාර්ය මණ්ඩල ඇතුළත් මානව සම්පත් පිළිබඳ ප්‍රකාශනය

5.4 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 7.4.1 ප්‍රකාරව, විගණන කමිටුව මඟින් තම නිරීක්ෂණ, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, විගණන කමිටුවේ පහත සඳහන් කරුණු විෂය පථයට අදාල කර නොතිබුණි.

i. අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිශ්චය කර ගැනීම හා වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම
ii. ආයතන තුළ ක්‍රියාත්මක වනු ලබන සියලු ක්‍රියාකාරකම් වලට අදාල අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය හා ඇගැයීම් කිරීම
iii. රාජ්‍ය ව්‍යාපාර කමිටුවට ඉදිරිපත් කරන ලද යෝජනා / මහ පෙන්වීම් පිළිබඳ සමාලෝචනය
iv. හඳුනාගත් පැරණි සෙමින් චලනය වන හා නිශ්ක්‍රීය තොග හා වෙනත් අයිතමයන් සම්බන්ධ ප්‍රකාශ

5.5 අයවැය පාලනය

රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛයේ 5.2.5 ඡේදය ප්‍රකාරව, වාර්ෂික අයවැය වාර්තාව සංයුක්ත සැලැස්මට අනුව, දීර්ඝ කාලීන පරමාර්ථ සහ වර්ෂයේ අරමුණු ඉටු කර ගැනීම පිණිස උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) අභ්‍යන්තර විගණනය
(ඈ) වාහන පරිහරණය
(ඉ) පර්යේෂණ පැවැත්වීම
(ඊ) සේවක කළමනාකරණය